සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020(I)**

| | | |
|---|---|---|
| **කාලය: පැය 03** | **ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (01-II)** | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>........................................ |

- **පළමුවන ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

---

01. (i) ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටවනු ලැබුවේ කුමන නෛතික ප්‍රතිපාදනය මගින් ද? (ලකුණු 02)

(ii) ලන්දේසි යුගයේ පැවති ඉහළ ම අධිකරණය කුමක් ද? (ලකුණු 02)

(iii) ශ්‍රී ලංකා නීතිඥ සංගමය බිහිවූයේ කුමන පනත බලාත්මක වීමෙන් අනතුරුව ද? (ලකුණු 02)

(iv) නීති මූලාශ්‍රයක් වශයෙන් බතාවියානු ව්‍යවස්ථා යොදා ගනු ලැබුවේ කුමන ජාතිකයන් විසින් ද? (ලකුණු 02)

(v) උසාවි ආඥා පනතේ 6 පරිච්ඡේදයේ දැක්වෙන උසාවි වර්ගය කුමක් ද? (ලකුණු 02)

(vi) ඉංග්‍රීසි නීතිය ලංකාවේ නීති ක්‍රමයට ප්‍රවේශ වූ ක්‍රම දෙක (02) මොනවා ද? (ලකුණු 02)

(vii) ශ්‍රේෂ්ඨාධිකරණයේ හා මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගත යුතු උපරිම වයස් සීමා පිළිවෙලින් දක්වන්න. (ලකුණු 02)

(viii) පහත දැක්වෙන එක් එක් නඩුකර ඉදිරිපත් කළ යුතු අධිකරණය නම් කරන්න.

(අ) මහමැතිවරණ ඡන්ද පෙත්සම්
(ආ) නඩත්තු සඳහා වූ ඉල්ලීමක්
(ඇ) තෙස්තමේන්තු නඩු
(ඉ) කාර්මික මණ්ඩලයක තීරණයට එරෙහි අභියාචනා
(ඊ) අනාචාරය සඳහා වන්දි
(උ) මුහුදු කොල්ලය

(ලකුණු 06)

02. (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන “එකම පිරිසිදු පුද්ගල නීතිය“ ලෙස හැඳින්වෙන පුද්ගල නීතිය නම් කරන්න. (ලකුණු 04)

(ii) එම පුද්ගල නීතියෙහි අදාළත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 16)

03. (i) ශ්‍රී ලංකාව තුළ විවාහයක් ලියාපදිංචි කිරීමට ප්‍රතිපාදන සලසා ඇති පනත් තුන (03) මොනවා ද? (ලකුණු 06)

(ii) “නතාලි අබේසුන්දර එ. ක්‍රිස්ටෝෆර් අබේසුන්දර (1998) ISLLR 185 නඩු තීන්දුව ශ්‍රී ලාංකීය නීති වංශ කතාවේ සංදිස්ථානයකි”. සාකච්ඡා කරන්න. (ලකුණු 14)

04. (i) 1952 අංක 44 දරන උඩරට විවාහ හා දික්කසාද පනතෙහි උපලේඛනයේ “උඩරට පළාත් (Kandyan Provinces)” යටතට ගැනෙන දිස්ත්‍රික්ක පහක් (05) දක්වන්න. (ලකුණු 05)

(ii) දෝන ඩයනා 1999-12-31 දින කන්තලේ මූලික රෝහලේ දී උපත ලැබීය. දැනට ඇය එප්පාවල පදිංචිව සිටියි. තමාට උඩරට නීතියේ ප්‍රතිපාදන අදාළ වන්නේ ද යන්න සම්බන්ධයෙන් ඇය නීති උපදෙස් අපේක්ෂා කරයි. ඇයට උපදෙස් ලබා දෙන්න. (ලකුණු 15)

05. (i) තේසවලාමෙයි නීතියෙහි ප්‍රධාන මූලාශ්‍ර හතර (04) නම් කරන්න. (ලකුණු 08)

(ii) තේසවලාමෙයි නීතියෙහි අදාළත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

06. (i) අභියාචනාධිකරණයේ සංයුතිය සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) අභියාචනාධිකරණය විසින් ක්‍රියාත්මක කරන අධිකරණ බලය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 15)

07. පහත දැක්වෙන කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) අධිකරණ සේවා කොමිෂන් සභාව

(ii) හේබියස් කෝපුස් රිට් ආඥා

(iii) කාති උසාවි

(iv) උඩරට නීතියේ විවාහ ක්‍රම

(ලකුණු 20)

*************